# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## සමාජ ආරක්ෂණ දායකත්ව බදු (සංශෝධන)

**2022 අංක 25 දරන සමාජ ආරක්ෂණ දායකත්ව බදු පනත**
**සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

---

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ
වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය විසින්
2026 මාර්තු මස 17 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2026 මාර්තු මස 03 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

[56 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

**මිල : රු. 29.00** **තැපැල් ගාස්තුව : රු. 150.00**

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

***2 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් (මෙහි මින් මතු ''ප්‍රධාන ප්‍රඥප්තිය'' යනුවෙන් සඳහන් කරනු ලබන) 2022 අංක 25 දරන සමාජ ආරක්ෂණ දායකත්ව බදු පනතේ 4 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද සඳහා ලියාපදිංචි වීම සඳහා වන පිරිවැටුමේ සීමාව, 2026 අප්‍රේල් මස 1 වන දින සිට බලාත්මක වන පරිදි වාර්ෂිකව රුපියල් මිලියන හැටේ සිට රුපියල් මිලියන තිස්හය දක්වා අඩු කිරීම වේ.

***3 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එම සංශෝධනය 4 වන වගන්තියට කළ සංශෝධනයන්ට ආනුෂංගික වේ.

***4 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ එම උපලේඛනයේ නීතිය බලපෑම වනුයේ-

(අ) Iඅ කොටසේ 25 වන අයිතමයෙහි සඳහන් කරනු ලබන යම් මෝටර් වාහනයකට අදාළ වන කාලසීමාවක් දක්වමින් එකී අයිතමය යටතේ විධිවිධාන සලසා ඇති නිදහස් කිරීම සීමා කිරීම; සහ

(ආ) Iආ කොටස යටතේ යම් මෝටර් වාහනයක් නිදහස් කිරීම,

වේ.

එල්. ඩී.- ඕ. 73/2025

## 2022 අංක 25 දරන සමාජ ආරක්ෂණ දායකත්ව බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය

**1.** මේ පනත 2026 අංක        දරන සමාජ ආරක්ෂණ දායකත්ව බදු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2022 අංක 25 දරන පනතේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම

**2.** (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2022 අංක 25 දරන සමාජ ආරක්ෂණ දායකත්ව බදු පනතේ 4 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එහි (ඇ) ඡේදයේ "2024 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසු" යන වචන සහ ඉලක්කම් වෙනුවට, "2024 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසු සහ 2026 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(2) එහි (ඇ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන්:-

"(ඈ) 2026 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසු ආරම්භ වන යම් කාලසීමාවක් සඳහා, යම් කාර්තුවක් සඳහා සමස්ත පිරිවැටුම රුපියල් මිලියන නවයක් ඉක්මවන හෝ ඉක්මවීමට ඉඩ ඇත්තා වූ දිනයේ සිට හෝ අනුයාත කාර්තු හතරක කාලසීමාවක් සඳහා සමස්ත පිරිවැටුම රුපියල් මිලියන තිස්හයක් ඉක්මවන හෝ ඉක්මවීමට ඉඩ ඇත්තා වූ දිනයේ සිට දින පහළොවකට වඩා පසු නොවී,";

PL 15708 - 342 (2026/03)

(3) එහි (ඇ) ඡේදයේ අතුරු විධානයේ "මේ (සංශෝධන) පනත ක්‍රියාත්මක වන දින සිට" යන වචන සහ "සලකනු ලැබිය යුතු ය." යන වචන වෙනුවට, පිළිවෙළින් "2024 මාර්තු මස 20 වන දින සිට" යන වචන සහ ඉලක්කම් සහ "සලකනු ලැබිය යුතු ය:" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(4) එහි (ඇ) ඡේදයේ අතුරු විධානයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අතුරු විධානය එකතු කිරීමෙන්:-

"එසේ ම තවදුරටත්, (ඇ) ඡේදය අදාළ වන්නා වූ බදු අය කළ හැකි තැනැත්තකු මේ (සංශෝධන) පනත ක්‍රියාත්මක වන දින සිට දින පහළොවකට වඩා පසු නොවී ලියාපදිංචි වීම සඳහා කොමසාරිස් ජනරාල්වරයා වෙත නිශ්චිතව දක්වා ඇති ආකෘතියෙන් ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කරනු ලබන්නේ නම්, එකී තැනැත්තා මේ උපවගන්තිය යටතේ ලියාපදිංචි වීමේ අවශ්‍යතාවයට අනුකූල වී ඇති බවට සලකනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එහි (ආ) ඡේදයේ "රුපියල් මිලියන එකසිය විස්සක් නොඉක්මවන අවස්ථාවක දී; හෝ" යන වචන වෙනුවට, "රුපියල් මිලියන එකසිය විස්සක් නොඉක්මවන අවස්ථාවක දී;" යන වචන ආදේශ කිරීමෙන්;

(2) එහි (ඇ) ඡේදයේ "2024 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසු" යන වචන සහ ඉලක්කම් සහ "රුපියල් මිලියන හැටක් නොඉක්මවන අවස්ථාවක දී," යන වචන වෙනුවට, පිළිවෙළින් "2024 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසු සහ 2026 අප්‍රේල් මස 1

වන දිනට පෙරාතුව'' යන වචන සහ ඉලක්කම් සහ ''රුපියල් මිලියන හැටක් නොඉක්මවන අවස්ථාවක දී; හෝ'' යන වචන ආදේශ කිරීමෙන්; සහ

(3) එහි (ඇ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන්:-

''(ඇ) ඒ තැනැත්තාගේ සමස්ත පිරිවැටුම 2026 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසු ආරම්භ වන යම් කාලසීමාවක් සඳහා, අනුයාත කාර්තු හතරක කාලසීමාවක් සඳහා රුපියල් මිලියන තිස්හයක් නොඉක්මවන අවස්ථාවක දී,''.

**4**. ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය සංශෝධනය කිරීම

(1) එහි Iඅ කොටසෙහි 25 වන අයිතමයෙහි ''ආනයනය කරනු ලබන'' යන වචන වෙනුවට, ''2026 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආනයනය කරනු ලබන'' යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්; සහ

(2) එහි Iආ කොටසෙහි -

(අ) 5 වන අයිතමයෙහි ''එල්. පී. ගෑස්; සහ'' යන වචන වෙනුවට, ''එල්. පී. ගෑස්;'' යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) 6 වන අයිතමයෙහි ''(රබර් කිරි, ක්‍රේප් රබර් හෝ රබර් ෂීට්).'' යන වචන වෙනුවට, ''(රබර් කිරි, ක්‍රේප් රබර් හෝ රබර් ෂීට්); සහ''; සහ

(ඇ) 6 වන අයිතමයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අයිතමය එකතු කිරීමෙන්:-

"7. 2026 අප්‍රේල් මස 1 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි, යම් මෝටර් වාහනයක්.".

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**5.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.